# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2470/14 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී. 24/51(VII).

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වන වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**බිමල් නිරෝෂන් රත්නායක,**
ප්‍රවාහන, මහාමාර්ග සහ
නාගරික සංවර්ධන අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 31 වැනි දින
කොළඹ දී ය.

**නියෝග**

2023 ඔක්තෝබර් මස 5 වන දින අංක 2352/29 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියෝග මගින් අවසන් වරට සංශෝධනය කරනු ලැබූ 1952 පෙබරවාරි මස 27 වන දින අංක 10,360 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1951 මෝටර් වාහන (විවිධ) නියෝගවල හඳුනාගැනීමේ අංක තහඩු නිකුත් කිරීම සම්බන්ධයෙන් නිශ්චිතව දක්වා ඇති ගාස්තුවලට අදාළ, එම නියෝගවල හතරවන උපලේඛනයේ 23 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන් ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:-

| | *I වන තීරය* | *II වන තීරය* |
|---|---|---|
| | විස්තරය | ගාස්තුව (රු.) |
| "24 | මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වැන් රථ හැර, වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක 100,000 ක් දක්වා විශේෂ අංක වෙන් කිරීම | 1,000,000.00" |

EOG 01 - 0043

1A - PG 7454 — 353 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*